ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,514 - 2026 නොවැම්බර් මස 06 සිකුරාදා - 2026.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
තනතුරු ඇබෑර්තු	1368
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩු බාහිරාදිය විකිණීම	—
පළාත් පාලන නිවේදන	—
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	1381

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 නොවැම්බර් මස 27 පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 නොවැම්බර් මස 13 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තනතුරු ඇබෑර්තු

නාවලපිටිය නගර සභාව

නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට මධ්‍යම පළාත් පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර	*පුරප්පාඩු සංඛ්‍යාව*
රියදුරු (දෛනික)	04

බඳවා ගැනීමේ සුදුසුකම් :

01.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය (දෛනික පදනම මත)

01.2 *සුදුසුකම්* :

01.2.1 ***අධ්‍යාපන සුදුසුකම්*** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

01.2.2 ***වෘත්තීය සුදුසුකම්*** : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

තනතුරු නාමය	*සම්පූර්ණ කළ යුතු සුදුසුකම්*
රියදුරු	තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03 කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද 'ඒ' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

01.2.3 ***පළපුරුද්ද*** : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය)..

01.2.4 ***කායික සුදුසුකම්*** :

I. සෑම අපේක්ෂකයකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 1/2ක් විය යුතුය.

01.2.5 ***වෙනත්:***

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ පදිංචිකරුවන් විය යුතුය. වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයකු විය යුතුයි.

III. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

IV. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ *නිවේදනයේ/ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

V. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.3 ***වයස :***

:

01.3.1 අවම වයස් සීමාව : අවුරුදු 18 යි
01.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 45 යි

01.4 ***බඳවා ගැනීමේ ක්‍රමය :***

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.4.1 ***ලිඛිත විභාගය*** : පහත සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය

1. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	පැය 01	100	40%
2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	පැය 01	100	20%

2. මෙම පරීක්ෂණය නාවලපිටිය නගර සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

3. තරඟ විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

4. සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු වේ.

5. **විභාගය සඳහා විෂය නිදෙර්ශය :**

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.
2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

01.4.2 *වෘත්තීය පරීක්ෂණය:*

පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය	40	ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
2. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම	40	
3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	20	
මුළු ලකුණු සංඛ්‍යාව	100	

01.5. *අයදුම් කළ යුතු ආකාරය:*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි "12x8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර **"නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම" ලෙස** අදාළ කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලියා, **2026.11.27** වැනි දිනට පෙර **"ලේකම්, නගර සභාව, නාවලපිටිය"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය.**නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**අයදුම්පත් සමග පහත ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය.:-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
4. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරි සහතිකය;
5. මෑතකදී ගත් චරිත සහතික 02ක්;
6. වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික;
7. පොලිස් වාර්තාව හා වලංගු රියදුරු බලපත්‍රය.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර, කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,

නගර සභාව, නාවලපිටිය.

2026 ඔක්තෝබර් මස 27 වැනි දින,

නාවලපිටිය නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

නාවලපිටිය නගර සභාවේ රියදුරු තනතුර (දෛනික වැටුප් මත) සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය

1. මුලකුරු සමඟ නම : .....
2. සම්පූර්ණ නම : .....
3. ජාතික හැඳුනුම්පත් අංකය :.....
4. උපන් දිනය : වර්ෂය :.....මාසය :..... දිනය :.....
5. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු:..... මාස :..... දින :.....
6. ස්ත්‍රී/පුරුෂ භාවය :.....
7. විවාහක/අවිවාහක බව :.....
8. ජාතිය :.....
9. ස්ථිර ලිපිනය :.....
10. දුරකථන අංකය :.....
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව :.....
12. **අධ්‍යාපන සුදුසුකම් :**

අ.පොෙ.ස (සා.පෙළ)විභාගය පිළිබඳ විස්තර:

පළමු වතාව
වර්ෂය හා මාසය :.....
විභාග අංකය :.....

දෙවන වතාව
වර්ෂය හා මාසය :.....
විභාග අංකය :.....

විෂයය	*ශ්‍රේණිය*	*විෂයය*	*ශ්‍රේණිය*
1		1	
2		2	
3		3	
4		4	
5		5	
6		6	
7		7	
8		8	
9		9	

13. වෘත්තීය සුදුසුකම්: .....
.....

14. පළපුරුද්ද : .....
.....

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්,තෝරා ගැනීමෙන් පසු දැනගත හොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .....මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව කාරුණිකව දන්වමි.

.....
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :.....

11-21

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික මට්ටමේ (අර්ධ ශිල්පීය) ආදාහනාගාර ක්‍රියාකරු තනතුර වෙනුවෙන් III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරෙහි පවත්නා පුරප්පාඩු සඳහා විවෘත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාත තුළ යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරප්පාඩු තනතුර	:	ආදාහනාගාර ක්‍රියාකරු
2. අනුමත බඳවා ගැනීමේ පටිපාටිය	:	මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික සේවයේ අර්ධ ශිල්පීය සේවා ව්‍යවස්ථා සංග්‍රහය
3. තනතුරේ ස්වභාවය	:	ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
4. වැටුප් කේත අංකය	:	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි PL - 02
5. වැටුප් පරිමාණය	:	රු. 41,800 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 65,560
6. බඳවා ගන්නා ශ්‍රේණිය	:	III ශ්‍රේණිය
7. අධ්‍යාපන සුදුසුකම්	:	(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම; හෝ (ii) ජාතික වෘත්තීය සුදුසුකම් හි (NVQ) 3 සුදුසුකම ලබා තිබීම (රා. ප. ව. 28/2016) අනුව
8. වෘත්තීය සුදුසුකම්	:	අදාළ නොවේ.
9. පළපුරුද්ද	:	මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
10. කායික සුදුසුකම්	:	සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
11. වෙනත්		(i) අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. (පදිංචිය සනාථ කළ යුතුය.) (ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. (iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

12. වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

13. බඳවා ගැනීමේ ක්‍රමය : අයදුම්පතේ සඳහන් කරුණු අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව, පවතින පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

14. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	50	උපරිම ලකුණු ලබා ගත් අයදුම්කරු පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ.
තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රශ්න කිරීම	40	
සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය	10	
මුළු ලකුණු	100	

15. සේවා කොන්දේසි :	
I.	වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
II.	පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.
III.	අදාළ පත්වීම් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත්වේ.
IV..	මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත් සභාව හා මැදදුම්බර ප්‍රාදේශීය සභාව වරින්වර නිකුත් කරන නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
V.	පත්වීම ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
16. අයදුම් කිරීමේ අනුපිළිවෙල :	
I.	අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආකෘතිය අනුව පමණක් සකස් කළ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර 2026.12.05 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බවට දන්වනු නොලැබේ.
II.	අයදුම්පතේ සඳහන් කරනු ලබන සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලියවිලි වල ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එම අවස්ථාවේ මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
III.	අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ අසම්පූර්ණ හෝ මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව මෙම ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.
17. අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :	
I.	ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-9 දක්වා කරුණුද දෙවන පිටෙහි 10-14 දක්වා කරුණුද තුන්වන පිටෙහි ඉතිරි ජේද ද ඇතුළත් වනසේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය මුද්‍රණය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කරගත යුතුය.

II.	අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් නොතාරිස්වරයෙකු, නීතීඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීක හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.
III.	යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලිපිය ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.
IV..	රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
18.	අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල මැදදුම්බර ප්‍රාදේශීය සභා ලේකම් සතුය.

ඩී. එම්. ඩී. අයි. කුමාරි,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2026 නොවැම්බර් මස 06 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.

ආදර්ශ අයදුම්පත්‍රය

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර ක්‍රියාකරු තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

01. (I) මුලකුරු සමඟ නම : .....

(II) මුලකුරු වලින් හැඳින්වෙන නම් : .....

02. පෞද්ගලික ලිපිනය :.....

03. දුරකථන අංකය : .....

04. උපන්දිනය :- වර්ෂය : ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

05. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස: අවුරුදු : ☐☐ මාස: ☐☐ දින: ☐☐

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ඔව් ☐ නැත ☐

08. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

09. විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :.....

11. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර (ලබා ඇති විශිෂ්ඨ හෝ සම්මාන සාමාර්ථය අනුව විෂයයන් පිළිවෙලින් සඳහන් කරන්න.

පෙනී සිටි වාරය : පළමුවර
විභාග අංකය : .....
වර්ෂය : .....

පෙනී සිටි වාරය : දෙවන වර
විභාග අංකය : .....
වර්ෂය : .....

අනු අංකය	*විෂයය*	*සාමාර්ථය*	*අනු අංකය*	*විෂයය*	*සාමාර්ථය*
01			01		
02			02		
03			03		
04			04		
05			05		
06			06		
07			07		
08			08		
09			09		
10			10		

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :

. .

13. වෙනත් සුදුසුකම් :

14. දැනට ප්‍රාදේශීය සභාවේ දෛනික පදනම මත සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :
    I. සේවයේ යෙදී සිටින තනතුර
    II. කවදා සිට ද යන වග

15. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත් තෝරා ගැනීමෙන් පසු හෝ පත්වීමක් ලද පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

.....,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .....මයා/මිය/මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.....,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :.....

සහතික කරන්නාගේ සම්පූර්ණ නම
තනතුර :
ලිපිනය :

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

උක්ත කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,510 හා 2026.10.09 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ ගිනිහට තනතුරු පුරප්පාඩු සම්බන්ධවයි.

එම *ගැසට් පත්‍රයේ* පළකර තිබූ පුරප්පාඩු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.11.16 දක්වා දීර්ඝ කරනු ලබන අතර, අදාළ *ගැසට්* නිවේදනයේ අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

ඒ. ඒ. වී. සම්පත්,
නාගරික කොමසාරිස්,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

11-101

පළාත් පාලන නිවේදන

මහනුවර මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබා දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවක් එහි සඳහන් ස්ථානයන්හි පැවැත්වීම සඳහා 2027 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම පිණිස මා වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා වලට බලපත්‍ර දීමේ පනතේ 06 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාවක් අසල හෝ එකී සමාජ ශාලාවක් සඳහා අපේක්ෂිත ස්ථානයක් අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාවක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 04 ක් ඇතුළත විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*සමාජශාලාවේ සභාපති ද ලේකම් ද යන වග*	*සමාජ ශාලාවේ නම*	*සමාජ ශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය*
ලේකම්	ලේකම්	ඕල්ඩ් ට්‍රිනිටියන්ස් ස්පෝර්ට්ස් ක්ලබ්	අංක 28, අස්ගිරිය, මහනුවර

ඒ. පී. වන්දසිරි විජයනායක,
නගරාධිපති,
මහා නගර සභාව, මහනුවර.

2026 ඔක්තෝබර් මස 21 දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.

11-07

අඹගමුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අඹගමුව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් වලට අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාස තුනක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වගන්තිය යටතේ උපලේඛනයේ සඳහන් මංමාවත් අඹගමුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ස්ථිර වශයෙන්ම පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. ඩී. කපිල නාකන්දල,
සභාපති,
අඹගමුව ප්‍රාදේශීය සභාව,

1.	මාර්ගයේ නම	-	ලක්ෂපාන දිය ඇල්ල මාර්ගය
	ග්‍රාම නිලධාරී වසම	-	කොත්තැල්ලෙන
	ආරම්භය	-	කොත්තැල්ලෙන ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා ශාලාව අසල
	අවසානය	-	ලක්ෂපාන ඇල්ල පාමුල
	මාර්ගයේ පළල	-	අඩි 14
2.	මාර්ගයේ නම	-	මාදෙණිය සිට නපුරු ඇල්ල හරහා මොරතොටයාවත්ත දක්වා මාර්ගය
	ග්‍රාම නිලධාරී වසම	-	කෙහෙල්වරාව
	ආරම්භය	-	මාදෙණිය පාසල අසල සිට නපුරුඇල්ල හරහා
	අවසානය	-	මොරතොටයාවත්ත ප්‍රධාන මාර්ගය දක්වා
	මාර්ගයේ පළල	-	අඩි 14

11-61

මාතර මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලා වලට බලපත්‍ර ලබා දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාවලට එහි සඳහන් ස්ථානයන්හි පැවැත්වීම සඳහා 2027 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා වලට බලපත්‍ර දීමේ පනතේ 06 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජ ශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 04 ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

නෙලුම් ඒ ගමගේ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මාතර.

2026 ඔක්තෝබර් මස 26 වැනි දින,
මහා නගර සභාව,
මාතර.

උපලේඛනය

අයදුම්කරුගේ නම	*සමාජශාලාවේ ලේකම්/ සභාපති/කළමනාකරු*	*සමාජ ශාලාවේ නම*	*සමාජ ශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය*
01. එස්. වී. සමන්ත සිල්වා මයා	ලේකම්	පැරකුම් ක්‍රීඩා සමාජය	අංක 71, බතූතා පාර, මාතර.
02. කේ. එස්. සුනිල් මයා	ලේකම්	ඔළුසිස් ක්‍රීඩා සමාජය	අංක 76 ,රාහුල පාර, මාතර.

11-23

හාලි ඇල ප්‍රාදේශීය සභාව

2027 වර්ෂය සඳහා වන කෙටුම්පත් අයවැය ලේඛනය පරීක්ෂා කර බැලීම වෙනුවෙන් මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව හා 2020 අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 2027 වර්ෂයට අදාළව පිළියෙල කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය 2026.10.23 දින සිට 2026.11.03 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ප්‍රදේශයේ මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

පී. සී. වරුෂමාන,
ගරු සභාපති,
ප්‍රාදේශීය සභාව,
හාලි ඇල.

දු. ක. අංක : 055-2294275/055-2295075.

11-18

බෙන්තොට ප්‍රාදේශීය සභාව

වීථි නම් කිරීමේ නිවේදනය

බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් මාර්ගය එකී උපලේඛනයේ සඳහන් "යෝජිත නාමය " අලුතින් නම් කිරීම සඳහා 2026.06.09 දින පැවති බෙන්තොට ප්‍රාදේශීය සභා මහ සභාවේ දී අංක 5.5.1 දරන යෝජනාව යටතේ සම්මත කරනු ලදුව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා පනතේ (ආනුෂාංගික විධිවිධාන පනත) 2(1) (අ) වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව පහත උපලේඛනයේ විස්තර සඳහන් පරිදි අදාළ මාර්ගය යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බැව් මින් නිවේදනය කරමි.

ප්‍රේමකුමාර විජේවර්ධන,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

මාර්ගය	*යෝජිත නාමය*
01. හුන්ගන්තොට, තොටවත්ත පාර	රණවිරු මාවත

11-19

සූරියවැව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ දැක්වෙන නියමය යටතේ, පිළියෙල කරන ලද සූරියවැව සභා බල ප්‍රදේශයේ අංක 103 දරන සූරියවැව ග්‍රාම නිලධාරී වසමේ ද, අංක 105 දරන සමාජසේවාපුර ග්‍රාම නිලධාරී වසමේ කොටසක් වන ගල්වැව හන්දිය ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලු නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකම සටහන් කර ඇති තක්සේරු පොත, පහත සඳහන් ස්ථානයේ එහි නිශ්චිතව දක්වා ඇති කාලයන් ඇතුළත, ගාස්තු අය කිරීමකින් තොරව මහජනතාවගේ පරීක්ෂා කිරීම සඳහා ප්‍රදර්ශනයට තබා තිබෙන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. එක් එක් දේපළ හිමියා වෙත නිකුත් කරනු ලබන තක්සේරු නිවේදනය තමන් වෙත ලැබී දින තිහක් ඇතුළත එකී වාර්ෂික තක්සේරුව පිළිබඳව කිසියම් විරෝධතාවක් වේ නම්, ලේකම්, සූරියවැව ප්‍රාදේශීය සභාව, සූරියවැව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ එකී කාලය ඇතුලත සතියේ වැඩ කරන දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා අතර කාලය තුළ අතින් ගෙනවිත් භාර දිය හැකි බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ. නියමිත කාලයෙන් පසුව ලැබෙන කිසියම් විරෝධතාවයක් වේ නම්, ඒ විරෝධතා සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තක්සේරු පොතෙහි කිසියම් වාර්ෂික තක්සේරුවක් පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමට ඉඩදෙනු ලබන්නේ, ඒ වාර්ෂික තක්සේරුව අදාළ වන දේපළෙහි අයිතිකරුට හෝ එහි නීත්‍යානුකූල පදිංචිකරුට පමණක් බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ. එම් නිසා තක්සේරු පොත පරීක්ෂා කිරීමට පැමිණෙන තැනැත්තා විසින් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම අනිවාර්ය බව සලකන්න.

තක්සේරු පොත ප්‍රදර්ශනය කරන ස්ථානයේ ලිපිනය

සූරියවැව ප්‍රාදේශීය සභාව,

සූරියවැව.

තක්සේරු පොත පරීක්ෂා කළ හැකි දින හා වේලාවන් :

2026.11.09 දින සිට 2026.11.20 දින දක්වා

සතියේ වැඩ කරන දින වල පෙරවරු 8.30 සිට පස්වරු 4.30 දක්වා

එම්. ඉන්දික තුෂාර,
සභාපති,
සූරියවැව ප්‍රාදේශීය සභාව.

11-64

හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

2027 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීමට අවස්ථාව සැලසීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වන වගන්තියෙන් ලැබී ඇති ප්‍රකාරව ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2020.10.29 දින *ගැසට්* පත් අංක 2199/25 මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද "2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති" අංක 10(2) (ආ) ප්‍රකාරව 2027 වර්ෂය වෙනුවෙන් හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කිරීමට නියමිත කෙටුම්පත් අයවැය ලේඛනය, 2026.11.03 වන දින සිට වැඩ කරන දින 07ක් දක්වා කාර්යාල වේලාව තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ දී අවස්ථාව සලසා දෙනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

ආර්. එම්. ජගත් කුමාර රාජපක්ෂ,
සභාපති,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව.

11-20

ගාල්ල මහා නගර සභාව

2027 වසර අයවැය ලේඛනය

2027 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුලත් කෙටුම්පත් අයවැය ලේඛනය 2026.11.12 දින සිට 2026.11.20 දක්වා දින 07 ක කාලයක් ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 212 "ආ" වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුනිල් ගමගේ,
නගරාධිපති.

2026 ඔක්තෝබර් මස 29 වන දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

11-45